**ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 08 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. **ගිණුම්**

-------

2.1 **විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 1,001.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 910.94 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 90.06 ක් හෙවත් සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ප්‍රතිශතයක් ලෙස** |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 849.50 | 824.88 | 24.62 | 2.90 |
| මූලධන | 151.50 | 86.06 | 65.44 | 43.19 |
| **එකතුව** | **1,001.00** | **910.94** | **90.06** | **9.00** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂයය අංක 20701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 50.59 | 31.46 | 30.59 | 37.05 | 130.00 | 93.86 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුවේ යටතේ අංක 6000/0000/00/0015/0089/000 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 100.38 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු. 12,062,055 ක් වූ තැන්පතු 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට වර්ෂ 3 කට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණු එකතුව රු. 1,237,806 ක් වූ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------

**3.3.1 අභ්‍යන්තර විගණනය**

---------------------

අභ්‍යන්තර විගණක තනතුර 2015 සැප්තැම්බර් 14 දින සිට පුරප්පාඩුව පැවතීම නිසා සහ ප්‍රමාණවත් පුහුණු කාර්යය මණ්ඩලයක් නොමැතිවීම නිසා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි.

**3.3.2 විගණන හා කළමනාකරණ කමිටුව**

-----------------------------------

2015 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර එකක් පමණක් පවත්වා තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

-------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-----------------------------------

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා **2016** මාර්තු 17 දින වන විට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, ප්‍රධාන කාර්යාලයේ හා නැගෙනහිර පළාත් කාර්යාලයේ එම වාර්තා 2016 ජූනි මාසය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කෞතුකාගාර සතු කෞතුක භාණ්ඩ එම සමීක්ෂණයට අතුළත් කර නොතිබුණි.

**(ආ) ඌන උපයෝජිත වත්කම්**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) රංචාමඩම කෞතුකාගාරය විවෘත නොකිරීම**

--------------------------------------------

රංචාමඩම ප්‍රාග් ඓතිහාසික කෞතුකාගාරය සඳහා 2012 හා 2014 වර්ෂවල පිළිවෙලින් රු.5,500,000 ක් හා රු.728,800 ක් වැයකර තිබුණි. ඉඩමේ අයිතිය නොතිබීම, ගොඩනැගිලි නඩත්තුව, පිවිසුම් මාර්ගය හා පොදු පහසුකම් නොතිබීම වැනි ගැටළු නිරවුල් කර නොගැනීම මත 2016 මැයි මාසය වනවිටත් කෞතුකාගාරය ඌන උපයෝජිතව පැවතුණි.

**(ii) පොළොන්නරුව සංචාරක නිවාසය සඳහා සෙවිලි තහඩු භාවිතය**

---------------------------------------------------------------------

2014 දෙසැම්බර් 31 දින මිලදී ගත් රු. 1,141,950 ක් වටිනා අඩි 6, 8 හා 10 ප්‍රමාණයේ සෙවිලි තහඩු 336 ක් හා මුදුන් සෙවිලි තහඩු 96 ක් 2016 මැයි මාසය වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**3.5 කාර්යසාධනය**

**------------------**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**------------------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) පුරාවිද්‍යා පනත සංශෝධනය කිරීම**

-------------------------------------------

පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවට වැඩි බලතල පැවරෙන ලෙස 1940 අංක 9 දරන පුරාවස්තු ආඥාපනතට හා 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතට වෙන වෙනම සංශෝධනයන් ඇතුළත් කිරීමට යෝජනා වී තිබුණි. එම පනතට අදාළ නිර්දේශයන් 2014 පෙබරවාරි මාසයේදී ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. 2014 අගෝස්තු 12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව අදාළ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව දෙපාර්තමේන්තුවේ පසු විපරම් කටයුතු දුර්වල මට්ටමක පැවතීම නිසා අපේක්ෂිත අරමුණ 2016 මැයි මාසය වන විටත් ඉටු කර නොතිබුණි.

**(ආ) පුරාවස්තු ලේඛනගත කිරීම**

-----------------------------------

2008 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තියට අයත් 3 වන අරමුණ වශයෙන් " පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක සහ චංචල පුරාවස්තු ලේඛනගත කිරීම" සඳහන් කර තිබුණි. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමය යටතට ගැනෙන චංචල පුරාවස්තු ලේඛනගත කිරීම, දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වෙමින් පැවතියද, වෙනත් රාජ්‍ය ආයතන, පුද්ගලික ආයතන, ආගමික ස්ථාන හා පුද්ගල සන්තකයේ පවතින චංචල පුරාවස්තු විශාල ප්‍රමාණයක් ලේඛනගත කළ යුතුව පැවතුණි.

**(ඇ) දීඝවාපිය දාගැබේ සංරක්ෂණ කටයුතු**

-------------------------------------------

දීඝවාපිය ස්තූපය වටා පිහිටි අඩි 18 ක් පමණ උස චෛත්‍ය බැම්ම ශක්තිමත් නොවීම නිසා 2015 මාර්තු මාසය වන විට එම බැම්මේ සියයට 95 ක් පමණ ගලවා ඉවත්කර තිබුණු නමුත් සංරක්ෂණ කටයුතු ඒ සමඟ ආරම්භ කර නොතිබුණි. දීඝවාපී චෛත්‍ය සංරක්ෂණය සඳහා වූ විද්වත් උපදේශන සභාව 2015 පෙබරවාරි 19 දින චෛත්‍ය භූමියේ සිදුකළ නිරීක්ෂණයකින් පසු "දාගැබේ හැඩය තහවුරු වන සේ ඉදිකර සුදුහුණු තවරා කොත් පළඳා ප්‍රතිසංස්කරණය කළයුතු බවට" එකඟතාවයකට පැමිණ තිබුණි. මේ සඳහා වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය සැලැසුම් පිළියෙල කර 2015 ජූනි මාසයේදී අනුමත කර තිබූ මුළු වියදම් ඇස්තමේන්තුව රු. මිලියන 772 ක් වී තිබුණු අතර වර්ෂ 5ක් තුළ නිම කිරීමට තීරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ වැඩ 2015 අගෝස්තු 24 දින ආරම්භ කිරීමට නියමිතව තිබුණද 2015 වර්ෂය අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සංරක්ෂණ කටයුතු සඳහා 2014 වර්ෂයේදී ගඩොල් 377,000 ක් රු.6,032,000 කට වැඩබිමට සපයා තිබුණි. මෙම ගඩොල්වල ශක්තිය (ගඩොලක සම්පීඩන ධාරිතාවය) පරීක්ෂා කිරීම සඳහා එම ගඩොල්වල P.S.I. අගය පිළිබඳ නියැදි පරීක්ෂණ වාර්තාවක් විගණන කටයුතු සඳහා 2015 ඔක්තෝබර් මාසයේදී මොරටුව විශ්ව විද්‍යාලය මගින් සිදු කර ගන්නා ලදී. පරීක්ෂා කරන ලද නියැදියේ සියළුම ගඩොල් ප්‍රසම්පාදන පිරිවිතරවල සඳහන් P.S.I. 400 ට අඩුවිය. මෙම ගඩොල් වැඩ බිමට සපයන අවස්ථාවේ ප්‍රමිතිය පරීක්ෂා කර නොතිබූ අතර ගඩොල් පෝරණුවේදී ලබාගත් නියැදි පරීක්ෂණ වාර්තා පදනම්කර ගනිමින් සැපයුම්කරුට මුදල් ගෙවා තිබුණි.

**(ii)** දීඝවාපිය දාගැබ සංරක්ෂණයට 2014 දෙසැම්බර් මාසයේදී හා 2015 මුල් කාර්තුව සඳහා බාහිර පාර්ශවයන්ගෙන් සේවා (ශ්‍රමය හා වාහන) ලබාගෙන තිබුණි. මේ සඳහා ඇස්තමේන්තු අනුමත කර නොගෙන සේවා සපයාගෙන තිබුණි. ඉටුකළ වැඩ වෙනුවෙන් ගෙවිය යුතු මුදල රු.1,685,050 ක් බව අනාවරණය වුවද, ඉටු කළ සේවාවන්ගේ ප්‍රමාණාත්මක භාවය පිළිබඳ ගැටළු පැවතීම හේතුවෙන් සිවිල් ආරක්ෂක බලකායට හා වෙනත් පාර්ශවයන්ට අදාල බිල්පත් නිරවුල් කිරීමට නොහැකිවී තිබුණි.

**(ඈ)** **පුරාවිද්‍යා තෑගි අරමුදල**

---------------------------

නීති විරෝධී ලෙස ප්‍රයෝජනයට ගත් පුරාවස්තු ආපසු ලබා ගැනීමට, පුරාවස්තු ආරක්ෂා කිරීමට හෝ දායකත්වය දෙන පුද්ගලයන්ට, නිලධාරීන්ට, තොරතුරු සපයන්නන්ට හා ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්ට ඔවුන්ගේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වැඩි කිරීමේ අරමුණින් පුරාවිද්‍යා තෑගි අරමුදල ඇතිකර තිබුණි. පුරාවිද්‍යා තෑගි අරමුදලට 2010 වර්ෂයේ සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ රු.73,486,473 ක් ලැබී තිබුණි. ප්‍රතිලාභ ලැබිය යුත්තන් පිළිබඳ දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ගැටළු හේතුවෙන් එම මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට මෙම මුළු මුදල රජයේ ආදායමට බැරකර තිබුණි. මෙම අරමුදලින් හිමිකම් ලැබිය යුතු පොලිස් නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තු නිලධාරීන්ට ප්‍රතිලාභ නොලැබීම මත අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කර නොතිබුණි.

**(ඉ)** **නීලගිරිය දාගැබ සංරක්ෂණය**

----------------------------------

නීලගිරිය දාගැබ සංරක්ෂණයට 2015 වර්ෂය සඳහා රු.මිලියන 8 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර අර්ධ වර්ෂයකට රු. මිලියන 4 බැගින් වැය කිරීමට සැලසුම් කර තිබුණි. මුල් අර්ධ වර්ෂය සඳහා ව්‍යාපෘතියට අදාල සංරක්ෂණ ඇස්තමේන්තු අනුමත කර නොගැනීම නිසා සංරක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. 2015 දෙසැම්බර් මාසයේදී සිමෙන්ති, වැලි ඇතුළු ද්‍රව්‍ය මිලදී ගැනීම පමණක් සිදුකර තිබුණි. පසුව රු.මිලියන 2.3 ක් වෙනත් වැය විෂයකට මාරුකර තිබූ අතර ඉතිරි ශුද්ධ ප්‍රතිපාදනය වූ මිලියන 5.7 කින් රු. මිලියන 2.1 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

**(ඊ)** **යුධගනාව දාගැබ සංරක්ෂණය**

-----------------------------------

2015 වර්ෂය සඳහා රු. මිලියන 4 ක් ප්‍රතිපාදන සලසා තිබූ අතර ගඩොල් සපයා ගැනීමට නොහැකි වීම මත රු. මිලියන 3.7 ක් හෙවත් සියයට 93 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**3.6** **පාඩු හා හානි**

--------------

දෙපාර්තමේන්තුවේ හානි හා පාඩු සම්න්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** **අනුරාධපුර නව සංචාරක බංගලාව ඉදිකිරීමේ අක්‍රමිකතා**

------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාස්තු විද්‍යාත්මක උපදේශක සේවා (සැලැසුම් නිර්මාණය හා ඉදි කිරීම් ) සඳහා 2012 වර්ෂයේදී රු.443,000 ක් වරලත් වාස්තු විද්‍යාඥයෙකුට ගෙවා තිබුණි. නමුත් මෙම සංචාරක බංගලාව ඉදි කිරීමට අදාළ කිසිදු සේවාවක් ඔහුගෙන් ලබාගෙන නොතිබුණි.

(ii) උතුරු මැද පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ (ඉංජිනේරු සේවා) නිර්දේශයන්ට පටහැනිව රු. 1,418,483 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 (බී) මාර්ගෝපදේශය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා සකස් කළ ප්‍රකාශයක් සමඟ සියලු ලියවිලි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීයා වෙත යොමු කර අනුමැතිය ලබාගෙන අතිරේක වැඩ සඳහා ගෙවීම් කළ යුතු වුවත්, කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 25.3 ක් හෙවත් රු.4,222,928 ක් අතිරේක වැඩ සඳහා ඉහත පරිදි කටයුතු නොකර ගෙවීම් කර තිබුණි.

**(ආ) පොළොන්නරුව සංචාරක බංගලාව අළුත්වැඩියාව සඳහා දැව මිළදී ගැනීම**

2015 දෙසැම්බර් 26 දින වහළය අළුත්වැඩියාව සඳහා මිලදී ගෙන තිබූ රු.617,433 ක් වටිනා විවිධ ප්‍රමාණයේ දැව අතර ප්‍රමිතියෙන් තොර දැවද තිබුණි. ප්‍රමිතියෙන් තොර දැව සම්බන්ධයෙන් 2016 මැයි මාසය වන විටත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

**(ඇ) යතුරු පැදි භාවිතය**

දෙපාර්තමේන්තුව සතුව යතුරු පැදි ලියාපදිංචි පොත් 57 ක් තිබූ අතර එයින් 13 ක් භාවිතා කරන නිලධාරීන් හෝ ලබාදී ඇති ප්‍රාදේශීය කාර්යාල පිළිබඳ තොරතුරු නොතිබුණි. භාවිතයෙන් ඉවත් කළ යතුරු පැදි 10 ක් 2015 ඔක්තෝබර් මාසයේ සිට අපහරණ කටයුතු සිදු නොකර 2016 ජූනි මාසය වන විටත් ප්‍රධාන කාර්යාලයේ රඳවාගෙන තිබුණි.

## 3.7 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) අනුරාධපුර සංචාරක බංගලාව භාවිතය**

අනුරාධපුර නව සංචාරක බංගලාව ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේ රු. මිලියන 15.8 ක්ද, 2015 වර්ෂයේ රු. මිලියන 4.3 ක්ද වැය කර ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණි. සංචාරක බංගලාවට අවශ්‍ය ගෘහ උපකරණ මිලදී ගැනීමට 2016 මැයි මාසය වන විටත් කටයුතු කර නොතිබුණි. මේ නිසා ගොඩනැගිල්ල ඉදිකිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි.

**(ආ) අත්තනගල්ල, පල් කුඹුර, මුරුතවෙල වත්ත ඉඩම පවරා ගැනීම**

අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මුරුතවෙල වත්ත ඉඩම අක්කර 09 පර්චස් 22 කින් සමන්විත වී තිබුණි. මෙම ඉඩමේ පැරණි බල කොටුවක හෝ නගරයක ලක්ෂණ දැකිය හැකි බව 2000 වර්ෂයේදී අනාවරණය කරගෙන තිබුණි. පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා මෙම ඉඩම පවරා ගැනීමට අදාළ කටයුතු 2011 වර්ෂයේ ආරම්භ කර තිබූ නමුත් පසු විපරම් කටයුතු දුර්වලව පැවතීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පවරාගෙන නොතිබුණි. මෙම තත්ත්වය මත ඉඩමේ එළදා ආදායම 2013 වර්ෂයේ සිට රජයට අහිමිවීම හා ඉඩමේ අනවසර මාර්ග ඇතිවීම වැනි ගැටළුද සිදු වී තිබුණි.

**3.8** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 53 | 09 | 44 |
| (ආ) | තෘතියික මට්ටම | 56 | 38 | 18 |
| (ඇ) | ද්විතියික මට්ටම | 737 | 461 | 276 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 1,610 | 1,205 | 405 |
| | එකතුව | 2,456 | 1,713 | 743 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානී තනතුරුවලට අදාල අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ, තනතුරු ඇතුළු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 53 කින් 44 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුරු සඳහා වසර 06 කට වැඩි කාලයක සිට වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත්කර තිබුණු අතර මෙම තත්ත්වය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධනය පහත වැටීමට හේතුවී තිබුණි.

**(ආ)** දෙපාර්තමේන්තුව සඳහා සංරක්ෂණ සහකාර (වාස්තු විද්‍යා/කාර්මික නිලධාරී) තනතුරු 44 ක් අනුමත කර තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විට එම තනතුරු වලින් 32 ක් පුරප්පාඩුව පැවතීම නිසා සංරක්ෂණ ව්‍යාපෘතිවලට අදාල ඇස්තමේන්තු පිළියෙල කිරීම හා අධීක්ෂණ කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.